උපේක්ෂා සේනානායක

# මතක ශක්තියේ මිහිර රැගත් හුදෙකලාවේ ආවර්ජනය

"ජීවත්වනවා යනු කුමක්දැයි කිසිවකු ඇසූ කල ඊට දිය හැකි හොඳම හා එකම පිළිතුර වන්නේ සාමූහිකව පරිභෝජනය කරනවා යන්න නොවේද?"

මෙම පැනය නගනු ලබන්නේ "මාධ්‍ය පීඨයක් " ලෙසින් අප කාගේත් ගරුබුහුමන් ලබන එස් පියසේන ශූරීන් විසින් මෑතදී පළ කරන ලද හුදෙකලාවේ ආවර්ජනය නම් ග්‍රන්ථයේ ප්‍රස්ථාවනාව ආරම්භ කරමින් එතුමන් විසිනි. එකී පැනය හොඳින් දිගහැර ලිහා ඊට පිළිතුරු සෙවීමේ සංකීර්ණ ක්‍රියාවලියේ ප්‍රතිඵලය ලෙසින් ලියැවුණු ග්‍රන්ථයක් වශයෙන් මෙය පළමුව හඳුනා ගත හැකිය. එනයින් බැලූ කල පොදු මිනිස් වර්ගයා විසින් ජීවිතය නමැති ප්‍රශ්න පත්‍රයට පිළිතුරු බඳුනු ලැබීමේදී මුහුණපාන ආර්ථික ලසමාජීය දේශපාලනික හා ආගමික වටපිටාවෙන් පැන නගින ගැටලු පිළිබඳව කරන ලද යාවත්කාලීන මෙන්ම යතාර්ථවාදී විවරණයක් ලෙසින් හුදෙකලාවේ ආවර්ජනය සැලකිය හැකිය.

එකී ග්‍රන්ථයේ ඇති විශ්මයජනක වූත් ආඩම්බරකාරීවූත් පොදු කරුණ වන්නේ අනූතුන් වන වියේ පසුවන පියසේන ශූරීන් විසින් ස්වකීය විශිෂ්ඨ ස්මරණ ශක්තියෙන් විපුල ඵල ලබමින් පොදු ජනතාවට අතිශයින් වැදගත් තොරතුරු සම්භාරයක් මෙම කෘතිය හරහා සම්ප්‍රේශණය කර තිබීමයි ගතණ්හාවත් උපාදානයත් අත්හළ අතිශයි න් හික්මුණු දැවැන්ත මාධ්‍යවේදියෙකු සිය ශතකයකට ආසන්න ජීවන ගමන් මග තුල එකතුකර ගත් දැනුමෙන් අංශු මාත්‍රයක් හෝ ලියා තැබීමේ වටිනාකම උකහා ගැනීමට තරම් අප ශූර විය යුතුය.

කෘතිය ආරම්භයේදී අපට අත්දැකීමට ලැබෙන අනෙක් අපූරු ලක්ෂණය වන්නේ මෙම මාහැගි ග්‍රන්ථය සිය පාසල් මාතාවට පුද කරමින් පියසේනයන් විසින් ලියා තබන හෘදයාංගම සටහනයිග

"අප්පමාදෝ අමතපදං"<br>
ජනමාධ්‍යයට<br>
මා හැඩගැස්වූ<br>
ආනන්ද මාතාවන්ට<br>
ආදි ආනන්දීයයන්ට<br>
වත්මන් ආනන්දීයයන්ට<br>
සහ<br>
අනාගත ආනන්දීයයන්ට

මේ කුඩා සටහන තුල ලියැවී ඇති අපමණ හැඟුම් තුලින් පාඨකයා තුල ජනනය කරන ආනන්දය කෙසේ නම් විග්‍රහ කරම්ද?

මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය රැසක දශක ගනනාවක් සේවය කිරීමෙන් ලත් අත්දැකීම් ඔස්සේ ගොඩ නගා ගත් ඥානය සිය ග්‍රන්ථය තුලට ඒකරාශී කරන අතරම තම දිවි සැරියෙන් අල්ප මාත්‍රයක් ද ඊට එකතු කරන පියසේනයන් වත්මන් මාධ්‍ය කරුවන්ට කිසියම් වැදගත් උපදේශයක් සන්නිවේදනය කරයි. තණ්හාව නිසා උපදින ශෝකය හෝ භය කිසිදා අත් නොවිඳි තමන් ඉතා සැහැල්ලුවෙන් ජීවිතයේ සැඳෑ සමය ගෙවමින් තවමත් මාධ්‍යවේදියකු ලෙස ක්‍රියාකාරී ජීවිතයක් ගෙවන ආකාරය කෙටියෙන් එතුමා ලියා දක්වා තිබේ. ඒ කුඩා පරිච්ඡේදය තුල වත්මන් ජනමාධ්‍යවේදීන්ට උගත හැකි දෑ රැසකි.

දකුණු ඉන්දියාවේ (මදුරාසියේ) නියෝජ්‍ය මහකොමසාරිස්වරයා වශයෙන් කලක් සේවය කිරීමෙන් සහ අඛිල භාරත් ආකාශ්වානි ( All India Radio) ගුවන් විදුලි නාලිකාවේ සිංහල අංශයේ වැඩසටහන් සම්පාදක වරයකු ලෙස දිගු කලක් සේවය කිරීමෙන් ඉන්දියාවේ අභ්‍යන්තර දේශපාලන ආර්ථික සහ සමාජ අරගල පිළිබඳ අත්දැකීමෙන් ලත් පෘතුල අවබෝධය නිසා ඉන්දීය දේශපාලනයේ කලින් කල සිදුවන විචල්‍යතා ශ්‍රීලංකාව කෙරෙහි බලපාන ආකාරය පිලිබඳව පෙරයීම් කර ඉඟි පලකිරීමේ හැකියාවෙන් පියසේනයන් පොහොසත්ය. ඊට කදිම උදාහරණය වන්නේ හුදෙකලාවේ ආවර්ජන කෘතියේ ඇතුලත් පහත් සිනමා කරුවන් නිසා විනාශ වූ තමිල්නාඩු දේශපාලනය නම් ලිපියයි.

රාමසාමි නායක්කර් ගේ ද්‍රවිඩ කසගම් පක්ෂයේ ආරම්භය සිදුවූ යුගයේ ඉන්දීය දේශපාලනයේ




පැවති ප්‍රවණතා පිළිබඳව විග්‍රහ කරමින් දෙමළ රිදී තිරයේ ප්‍රකට තිර රචකයන් වූ සී එන් අන්නදුරේ මුතුවෙල් කරුණානිධි සහ ගැලරිය පිනවන සටන් නලුවකු වූ එම් ජී රාමචන්ද්‍රන් (එම් ජී ආර්) තමිල්නාඩු දේශපාලනයට සම්බන්ධ වු ආකාරය යට කී ලිපියේ පැහැදිලිව දක්වා තිබේග 1964 දී ඉන්දීය රජය සමඟ ශ්‍රී ලංකාව ඇති කරගත් ගිවිසුමේ (සිරිමා- ශාසත ගිවිසුම) ඇතුලත්ව තිබූ එකඟතා හා කොන්දේසි පිළිබඳව ජනමතයක් ගොඩ නගමින් දකුණු ඉන්දීය දේශපාලනය තුල පෙරළිකාරයන් බවට පත් වු ද්‍රවිඩ කගසම් පක්ෂයේ විකාශනය හා ජේයලලිතා ජයරාම් ගේ භූමිකාව පිළිබඳවත් ඔවුන් විසින් ඉන්දීය මධ්‍යම රජයටත් ඒ හරහා ශ්‍රී ලංකාව කෙරෙහිත් සිදුකරන බලපෑම් වල අභියෝගාත්මක ස්වරූපයත් එම ලිපිය තුල සවිස්තරාත්මකව දැක්වේ.

මේ හැරුණු කොට ඉන්දියාවේ මීළඟ ජනාධිපති (පිටුව36) ඉන්දියාවේ ප්‍රාන්ත ඡන්ද අනාගතයට බලපායිද (පිටුව 159) වසරකට පසු පාරාවළල්ලක් වූ ඉන්දියාවේ තෙළිඟු දේශය (පිටුව 223) වර්ධරාජාගේ පෙත්සමෙන් රජීව්ට තල්ලුවක් (පිටුව 239) අපි දෙමළ ව්‍යාපාරයට ඉන්දියාව බයවෙලා (පිටුව 244) සහ ඉන්දීය නව රජය අසල්වැසියනට කෙසේ සලකයිද (පිටුව 309) යන ලිපි ඇතුලු තවත් අතිරේක ලිපි කිහිපයක් ඔස්සේද අස්වැසි රාජ්‍යයේ විදේශ ප්‍රතිපත්තිය මෙන්ම අපේ රටේ දේශපාලනය කෙරෙහි ඔවුන්ගේ මැදිහත්වීම අරභයා පැහැදිළි අවබෝධයක් පාඨකයා තුල ඇතිකරවීමට මෙම කෘතිය සමත්වී තිබේ.

ශ්‍රී ලාංකික තරුණ කාන්තාවන් නුපුහුණු රැකියා සඳහා මැදපෙරදිග යාමත් සමඟ ඇති වී තිබෙන සාමාජීය ප්‍රශ්න සහ එසේ මැදපෙරදිග රැකියා සඳහා පිටත්ව ගිය කාන්තාවන් මුහුණපාන විෂමතා දුක් කම් කටොලු ලාංකීය සමාජයේ දැවෙන ප්‍රශ්නයක් වී ඇති බව සිහිකැඳවමින් ලියා තිබෙන කුර්දිස්ථාන් සහ ලොප්ජා යන ලිපි යුගලය පියසේනයන් අදටත් සමාජ ගැටලු කෙරෙහි අතිශයින් සංවේදී සැබෑ මාධ්‍යවේදියකු බව ප්‍රත්‍යක්ෂ කරවයි. නිල සංඛ්‍යා ලේඛන අනුව ශ්‍රී ලාංකි කයෝ 18 50 000 ක් විදේශ රැකියාවල යෙදී සිටිති මේ හැර නීති විරෝධී අන්දමින් පිටරටවලට සංක්‍රමණය වී ඇති සංඛ්‍යාව යටත් පිරිසෙයින් තව දෙලක්ෂයක්වත් වනු ඇතැයි පැවසේ. විදේශ රැකියා ඇබෑර්තු සඳහා අලුතින්ම එකතු වූ ඉස්ලාමීය රට කුර්දිස්ථානයයි. ඉරාක රජය යටතේ කුර්දිවරුන්ට ස්වයංපාලන බලතල පවරා දී තිබෙනවා විනා ලෝක සිතියමේ කුර්දිස්ථානය යැයි වෙනම රටක් නැත ගඉස්ලාම් විරෝධී ප්‍රචාරයන් ගෙන යන ජාති හිතෛශීන් වැඩි වැඩියෙන් දරුවන් බිහිකර සිංහල ජන අනුපාතය රැකගන්නැයි කෑ ගසන්නේ දරුවන් ලැබෙන වයසේ කාන්තාවන් ලක්ෂ 5 කට අධික පිරිසක් විදෙස් රැකියා වල යෙදී සිටින බව නොදැන නොවේ.

ශ්‍රී ලාංකික කතුන් මැදපෙරදිග ගෘහසේවිකාවන් සඳහා පිටත් කර යැවීම ඇරඹෙන්නේ 1978-79 වර්ෂයේය. ඒ පිළිබඳ ඉතිහාසය පියසේන ශූරීන් හුදෙකලාවේ ආවර්ජනය ග්‍රන්ථයේ සංක්ෂිප්තව දක්වා තිබේ. යටත් විජිත ආර්ථික පාලනයෙන් මිදීමත් සමඟ ධනවත් වූ මැදපෙරදිග රටවල් ගෘහසේවිකාවන් ඇණවුම් කළේ ඉන්දියාවෙන් සහ පාකිස්ථානයෙනි. ඉන්දියාවේ කාන්තා අභිමාන (Dignity of Indian Womenhood) යනුවෙන් එරට කම්කරු අමාත්‍යංශය නිකුත් කළ ධවල පත්‍රිකාවේ එරට රජය කාන්තාවන් මැදපෙරදිග යැවීම ප්‍රතික්ෂේප කිරීමේ හේතු පැහැදිලිව දක්වා



තිබේ.

1984 අගෝස්ත මාසයේ මදුරාසියේ මීනම්බක්කම් ගුවන් තොටුපොළේ සිදුවූ බෝම්බ පිපිරීමෙන් මදුරාසිය හරහා මැදපෙරදිග යෑමට සිටි ලාංකික කතුන් පිරිසක් ජීවිතක්ෂයට පත් වූ මොහොත ශෝකයෙන් සටහන් කරන පියසේනයන් ලාංකික කතුන් නුපුහුණු රැකියා සඳහා එතෙර යැවීමේ ආදීනව සිය කෘතිය තුල කිහිප විටක්ම අවධාරණය කොට තිබේ.

හුදෙකලාවෙ ආවර්ජන කෘතියේ මා වඩාත් අභිරුචියකින් කියැවූ පරිච් ජේද අතුරින් ඉදිරියෙන්ම සිටින්නේ විශ්ව සංගීතයේ පඤද්ඤදා (God Father) ගේ සිතාරය නිහඬ වෙයි (පිටුව 50) යන ලිපියයි. 1920 දී බරණැස උපන් රවිශංකර් ගේ අභාවය අලළා ලියැවුණු එම ලිපියේ බොලිවුඩ් සිනමාවේ රසබර තොරතුරු බොහොමයක් ඇතුලත්යග රවිශංකර්ට විශ්ව සංගීතයේ පඤද්ඤදා යන ගෞරව නාමය ලබා දෙන ලද්දේ සුප්‍රසිද්ධ බීට්ල්ස් ගායක ජෝර්ජ් හැරිසන් විසිනි. සම්මානනීය චිත්‍රපට නිෂ් පාදක සත්‍යජිත් රායිගේ අපූ ත්‍රිත්වයට සංගීතයෙන් පණ දුන්නේ රවිශංකර් බව අපි දනිමු

අපූර් සංසාර් චිත්‍රපටයේ අපූගේ රූබර බිරිඳ අපර්ණාගේ චරිතයට පණ පොවමින් සිනමාවට ප්‍රවිශ්ඨ වූ සුරූපී නිළි ශර්මිලා තාගොර් රායිගේ හඳුන්වාදීමක් බව දන්නේ සුලුපිරිසකි. විභූති භූෂන් බන්ධෝපාද්‍යායගේ අපූර් සංසාර් නවකථාව වංග බසින් සිංහලයට නගා චින්තා ලක්ෂමී සිංහාරච්චි විසින් ලියන ලද අපූගේ ජීවිතය කෘතියේ කවරය අදටත් සැරසෙන්නේ ශර්මිලා තාගෝර්ගේ මන බඳිනා සේයාරුවකිනි. ඉන්දියාවේ ක්‍රිකට් තරු ගැන සඳහන් කරන පියසේන ශූරීන් ශර්මිලා තාගෝර් විවාහ වූ මන්සූර් අලි ඛාන් හෙවත් පතාවුදි කුමාරයා (පතාවුදි නවාබ්) ඇතුලු රජ පවුල් අතර ක්‍රිකට් ක්‍රීඩාවේ අධිකාරියක් ගොඩනැගී තිබූ අයුරු ද විස්තරකොට තිබේ.

ශ්‍රී ලංකාවේත් අසල්වැසි ඉන්දියාවේත් ඉසව් කිහිපයක පසුබිම පිළිබඳව අපක්ෂපාතී විවරණයක් රැගත් හුදෙකලාවේ ආවර්ජන කලකට පසු කියවන්නට ලැබුණු අගනා කෘතියකි. එමෙන්ම තීරු ලිපි කලාව පිළිබඳව අපට බොහෝ දේ අත්දැකීමෙන් උගත හැකි වටිනා අත්පොතකි. කනස්සල්ලට කරුණ වන්නේ මෙවන් වටිනා කෘති වර්ථමානයේ සිටින මාධ්‍යකරුවන් අධ්‍යයනය කරනවාද යන්නයි.


